පදාර්ථයේ වෙනස්වීම්

1) ඔබේ පෙළපොතේ 96වන පිටුව අධ්‍යයනය කර පහත ලෝහ මූලද්‍රව්‍ය වාතයේ රත්කළ විට ලැබෙන නිරීක්ෂණ හා එයට අදාළ තුලිත රසායනික සමීකරණ ලියන්න.

2) පහත සඳහන් ලෝහ මූලද්‍රව්‍ය ඇසුරෙන් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
Na, Mg, Zn, Fe, Cu, Ag, Pt

i) ඇල් ජලය සමඟ ප්‍රතික්‍රියා කරන ලෝහ නම් කරන්න.

ii) උණු ජලය සමඟ ප්‍රතික්‍රියා කරන ලෝහ නම් කරන්න.

iii) හුමාලය සමඟ ප්‍රතික්‍රියා කරන ලෝහ නම් කරන්න.

iv) ජලය සමඟ කුමන හෝ තත්වයකදී ප්‍රතික්‍රියා නොකරන ලෝහ නම් කරන්න.

v) ඉහත ප්‍රතික්‍රියා සිදුවන අවස්ථා සඳහා තුලිත රසායනික සමීකරණ ලියන්න.

3) i) තනුක අම්ල සමඟ ප්‍රචණ්ඩ ලෙස ප්‍රතික්‍රියා කරන ලෝහ මොනවාද?

ii) තනුක අම්ල සමඟ සෙමෙන් ප්‍රතික්‍රියා කරන ලෝහ මොනවාද?

iii) එම ලෝහ, තනුක HCl අම්ලය සමඟ ප්‍රතික්‍රියාවට අදාළ තුලිත රසායනික සමීකරණ ලියන්න.

iv) තනුක අම්ල සමඟ ප්‍රතික්‍රියා නොකරන ලෝහ මොනවාද?

4) විද්‍යාව පෙළපොතේ පිටු අංක 99හි 16.7 ක්‍රියාකාරකම සිදුකර පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i) ඉහත ක්‍රියාකාරකම සිදුකළ විට ඔබ දුටු නිරීක්ෂණ මොනවාද?

ii) ඔබ දුටු නිරීක්ෂණ වලට හේතුවන රසායනික ප්‍රතික්‍රියා මොනවාදැයි හඳුනාගෙන ඊට අදාළ තුලිත රසායනික සමීකරණ ගොඩනගන්න.